පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදනය හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# පුරප්පාඩු

# පොල් පර්යේෂණ ආයතනය

පොල් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වතු) තනතුර

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර :**

**සුදුසුකම් :** පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය පිළිබඳ වූ උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Postgraduate) තිබීම සහ

**පළපුරුද්ද :** රජයේ දෙපාර්තමේන්තුවක / අර්ධ රාජ්‍ය දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක හෙක්ටයාර් 100 කට නොඅඩු පොල් වත්තක් පාලනය පිළිබඳව අවම වශයෙන් වසර 15 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

**අභ්‍යන්තර :**

**සුදුසුකම් :** පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය පිළිබඳ වූ උපාධියක් තිබීම සහ

**පළපුරුද්ද :** කළමනාකරු (වතු) ලෙස කළමනාකරණ මට්ටමේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

- **වයස** : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 53 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **වැටුප් කාණ්ඩය** : HM 1-1
- **වැටුප් පරිමාණය** : රු. 80,295/- 15X2270/- = 114,345/-
- **ආරම්භක වැටුප් තලය** : රු. 80, 295.00 - (2/2016(I) චක්‍රලේඛය ප්‍රකාරව)

**අනෙකුත් ප්‍රතිලාභ :**

1. මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   - i. ප්‍රවාහන දීමනාව - 50,000/-
   - ii. ඉන්ධන දීමනාව
   - iii. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
   - iv. වෘත්තීය දීමනාව
   - v. දුරකථන දීමනාව
   - vi. තේ දීමනාව

## 02. තාක්ෂණ නිලධාරී තනතුර - ශ්‍රේණිය III

**සුදුසුකම් :**

**බාහිර :**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග අවම වශයෙන් එකවර විෂයන් 6 කින් සමත් වී තිබීම.

සහ

අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා අංශයෙන් අදාළ විෂය සංයුතිය සමග එකවර විෂයන් තුනකින් සමත් වීම හා පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු ද්‍ය අවුරුදු ඩිප්ලෝමාවක් අදාළ ක්ෂේත්‍රය සඳහා ලබා තිබීම.

**අභ්‍යන්තර :**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග අවම වශයෙන් එකවර විෂයන් 6 කින් සමත් වී තිබීම හා පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමාවක් අදාළ ක්ෂේත්‍ර සඳහා ලබා තිබීම සමග ප්‍රාථමික මට්ටමේ තනතුරක වසර 5 සතුටුදායක සේවයක් සපුරා තිබීම.

**සටහන :** තෝරාගනු ලබන අයදුම්කරුවන් හට රසායනාගාරවල මෙන්ම ක්ෂේත්‍රයේ ද කටයුතු කිරීමේ හැකියාවද තිබිය යුතුය. යතුරු පැදි පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් ලබාතිබීම අමතර සුදුසුකමක්සේ සලකනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **වැටුප් කාණ්ඩය** : MA 2-2
- **වැටුප් පරිමාණය** : රු. 30,310/- 10X300/- 7X350/- 4X600/- 20X710/- = 52,360/-
- **ආරම්භක වැටුප් තලය** : රු. 30,310.00 - (2/2016 චක්‍රලේඛය ප්‍රකාරව)

**අනෙකුත් ප්‍රතිලාභ :**

- i. මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
- ii. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
- iii. තේ දීමනාව

## 03. තාක්ෂණික නිලධාරී (සිවිල්) තනතුර - ශ්‍රේණිය III

**සුදුසුකම් :**

**බාහිර :**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග අවම වශයෙන් එකවර විෂයන් 6 කින් සමත් වීම සහ අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා අංශයෙන් අදාළ විෂයය සංයුතිය සමග එකවර විෂයන් තුනකින් සමත් වී තිබීම.

සහ

අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 මට්ටමට අඩු නොවූ සුදුසුකමක් ලබා තිබීම.

- **වයස** : අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.
- **වැටුප් කාණ්ඩය** : MA 2-2
- **වැටුප් පරිමාණය** : රු. 30,310/- 10X300/- 7X350/- - 4X600/- - 20X710/- = 52,360
- **ආරම්භක වැටුප් තලය** : රු. 30,310.00 (2/2016 චක්‍රලේඛය ප්‍රකාරව)

**අනෙකුත් ප්‍රතිලාභ**

1. මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   - i. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
   - ii. තේ දීමනාව

**පොදු කොන්දේසි :**

01. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
02. අයදුම්කරු ඉතා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුය.
03. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමැති විය යුතුයි.

**පොදු ප්‍රතිලාභ :**

01. 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2016.04.25 දිනැති අංක 2/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
02. දායකත්වය වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
03. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහාද දායක වනු ඇත.)
04. පොල් පර්යේෂණ ආයතනයේ සේවකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභද හිමිවනු ඇත.

අයදුම්කරුවන් විසින් **උප්පැන්න සහ අනෙකුත් අදාළ සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත් වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරීගෙන් විය යුතුය.) ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග අයදුම්කරු විසින් අත්සන් කරන ලද** තම අයදුම්පත 2021.08.05 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ප්‍රමාද වී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් කලින් එවිය හැකිය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාළ සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

මේ පිළිබඳ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

මෙම දැන්වීම පොල් පර්යේෂණ ආයතනයේ වෙබ් පිටුව වන www.cri.gov.lk මඟින්ද බලාගත හැක.

**සභාපති,**
**පොල් පර්යේෂණ මණ්ඩලය**
**ලුණුවිල.**

Source: Dinamina, Daily News (2021.06.25)